## වයාපාර කළමණාකරණ කමිටුව හා 2019 යල පෙර කන්න රැස්වීම -රිදියගම ව්‍යාපාරය

දිනය - 2019.03.12

වෙලාව - පෙ.ව9. 30

ස්ථානය- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාව

# සහභාගී වු රජයේ නිළධාරීන්

### *වාරිමාර්ග කළමණාකරණ අංශය*

01.කේ.කේ.ඉන්ද්‍රානි මිය - නේවාසික ව්‍යාපාර කළමණාකරු

02.ඩබ්.එන්.ජේ.වීරසිංහ මිය - සංවර්ධන නිළධාරි

03.ඩබ්.එම්.එන්.ලක්මාලි මිය - සංවර්ධන නිළධාරි

04.ඒ.කේ.එන්.ප්‍රියදර්ශනි මිය - සංවර්ධන නිළධාරි

### *වාරිමාර්ග දෙපාර්තමේන්තුව*

01. කේ.එච්.එන්.එස් කුමාර මයා - වාරිමාර්ග ඉංජිනේරු - අ/තොට
02. එච්.එච්.එන්.එච් පීරිස් මයා - ඉංජිනේරු සහකාර- වා.දෙ අ/තොට
03. ඩබ්.ජී.සීකොස්තා මයා - ඉංජිනේරු සහකාර - වා:දෙ අ/තොට
04. ඩබ්.සී රත්න කුමාර මයා - සංවර්ධන නිලධාරි- වා:දෙ අ/තොට
05. කේ.ජී.එස් දමයන්ති මිය -සංවර්ධන නිලධාරි- වා:දෙ අ/තොට

### *කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

01.එන්.පී.ඒ ගුණවර්ධන මයා - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක - අ/තොට

02. ඊ.ජේ කාන්ති මිය - කෘෂිකර්ම උපදේශක විෂය භාර නි: වී/පැ.ස/වලව - අ/තොට

03.පී.කේ.එන්.එන් ගුණසේකර මයා - කෘෂිකර්ම උපදේශක විෂය භාර නිOFC/Fruit/වලව- අ/තොට

04. එන්.ටී සිරිවර්ධන මයා - කෘෂිකර්ම උපදේශක අ/තොට

### *වී අලෙවි මණ්ඩලය*

01.පී.අයි.ඩී.එස් හෙන්දහේවා මයා - වී අලවි මණ්ඩලය - දෙහිගහලන්ද

### *ගොවි නියෝජිතවරු*

1. ඒ.පී.විමලදාස මයා -ලේකම් ප්‍රගති ගොවි සංවිධානය
2. ඩී.ඒ කරුණාදාස මයා - භාණ්ඩාගාරික ප්‍රගති ගොවි සංවිධානය
3. හැන්ඩිඅබේදීරමයා - ලේකම්එකමුතුගොවිසංවිධානය
4. ඊ.පී.ජිනදාස මයා - භාණ්ඩාගාරික සරුකෙත/රුහුණු
5. ආර්.ජී ඥානපාල මයා - ලේකම් ගාමිණී ගොවි සංවිධානය
6. ඉන්ද්‍රා පිතරණ මිය - භාණ්ඩාගාරික පුබුදු ගොවි සංවිධානය
7. ඩී.එම් රත්නපාල මයා - සභාපති වලව ගොවි සංවිධානය

8. ඒ.එම් සුදුසිංහ මයා - සභාපති ජේරපුත්ත ගොවි සංවිධානය
9. ශෂී එදිරිසූරිය මයා - ලේකම් සුහද ගොවි සංවිධානය
10. ජී.ජී තරංග මයා - සභාපති පරකුම් ගොවි සංවිධානය

න්‍යාය පත්‍රානුකූලව පළමුව ආගම සිහිකිරීමෙන් පසු නේවාසික ව්‍යාපෘති කළමනාකරු කේ.කේ ඉන්ද්‍රානි මහත්මිය විසින් පැමිණ සිටි පිරිස පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ ලේකම් මහතා විසින් පසුගිය වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි. එම වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් වලව ගොවිසංවිධානයේ ගරු සභාපතිතුමාගේ සහ පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් වාර්තාව සභා සම්මත විය.

<u>ලිපි ඉදිරිපත් කිරීම</u>

අහබඩවිල ගම්මානයට පානීය ජලය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කල ලිපියක් ලැබී තිබුණු අතර එය නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමිය විසින් සභාවට ඉදිරිපත් කලාය.

එම ගම්මානය රිදියගම වැවට ඉහලින් පිහිටා ඇති බවත් රුහුණු පුර ජල යෝජනා ක්‍රමයටත් රිදියගම වැවෙන් ජලය ලබා දෙන බැවින් එම ගම්මානයට වෙනම ජල වයාපෘතියක් ලෙස ජලය ලබා දිය නොහැකි බව ව්‍යාපාර කමිටුව තීරණය කරන ලදී.

කෙසේ නමුත් රුහුණු පුර ජල යෝජනා ක්‍රමය මගින් ඉල්ලීම් කර ඇති එම ජල ව්‍යාපෘතියට ජලය ලබා දිය හැකි ද යන්න සාකච්ඡා කර බැලිය හැකි බව වාරිමාර්ග ඉංජිනේරු මහතා කියා සිටියේය.

## 01. <u>ආයතන සංවර්ධන කටයුතු- නේවාසික ව්‍යාපෘති කළමනාකාරු කේ.කේ ඉන්ද්‍රානිමිය</u>

ගොවි සංවිධාන 15 ක නිලවරණ කටයුතු මැයි හා ජූනි මාසවල පැවැත්වීමට කටයුතු යොදා ඇතිබවත් සුහද,ජේරපුත්ත,වලව යන ගොවි සංවිධාන විගණන කටයුතු සිදු කර ඇති බවත් මේ වන තෙක් විගණනය කර නොමැති ගොවි සංවිධාන හැකි ඉක්මනින් විගණන කටයුතු අවසන් කරන ලෙස දන්වා සිටියාය.

## <u>ආයතන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය - 2019පෙබරවාරි මාසය</u>

| අ/අ | ගොවි සංවිධානය | නිළවරණ පැවැත්වීම | මහසභා පැවැත්වීම | කාරකසභා පවැත්වීම | මුදල් සාරාංශ ලැබීම් | විගණනය | ව්‍යාපාර කමිටුවට පමිණීම |
|---|---|---|---|---|---|---|---|
| 1. | මහානාග | x | x | √ | √ | x | x |
| 2 | පැරකුම් | x | x | √ | √ | x | √ |
| 3 | ගජබා | x | x | √ | √ | x | x |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | එක්සත් | x | x | √ | √ | x | x |
| 5 | නීල සේනාපති | x | x | √ | √ | x | x |
| 6 | විජය | x | x | √ | √ | x | x |
| 7 | සුහද | x | x | √ | √ | √ | √ |
| 8 | සරුකෙත | x | x | √ | √ | x | √ |
| 9 | මහසෙන් | x | x | x | √ | x | x |
| 1 | අල්අක්බර් | x | x | √ | √ | x | x |
| 11 | දිමුතු | x | x | √ | √ | x | x |
| 1 | එකමුතු | x | x | √ | √ | x | √ |
| 1 | ථේරපුත්ත | x | x | √ | √ | √ | √ |
| 1 | රුහුණු | x | x | √ | √ | x | √ |
| 1 | පුබුදු | x | x | √ | √ | x | √ |
| 1 | වීර | x | x | √ | √ | x | x |
| 1 | නීල | x | x | √ | √ | x | x |
| 1 | සේනානායක | x | x | x | √ | x | x |
| 1 | ඉසුරු | x | x | √ | √ | x | x |
| 2 | සමගි | x | x | √ | √ | x | x |
| 2 | ගාමිණී | x | x | √ | √ | x | √ |
| 2 | කාවන්තිස්ස | x | x | √ | √ | x | x |
| 2 | ගෝඨාභය | x | √ | √ | √ | x | x |
| 2 | වලව | x | √ | √ | √ | √ | √ |
| 2 | ප්‍රගති | x | x | √ | √ | x | √ |
| 2 | **එකතුව** | **0** | **02** | **23** | 25 | **03** | **10** |

. 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ සුහද ගොවි සංවිධානය ලියාපදිංචි කර ඇතත් මේ වන තෙක් ලියාපදිංචි සහතිකයක් ලැබී නොමැති බව ගොවි සංවිධානයේ ලේකම් ශෂී එදිරිසූරිය මහතා කියා සිටියේය

## 02. වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු-කේ.එච්.එන්.එස් කුමාරමහතා

**රිදියගම ජලාශයේ ජල ධාරිතාවය - අක්කර අඩි 24600**
**ජල කදේ උස - අඩි 18 අගල් 8**

වගා කටයුතු සදහා ජලය අවශ්‍ය වූ විට උඩවලව ජලාශයෙන් ලබාගත හැකි බව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කරසිටි අතර රක්ෂිත ප්‍රශ්න විසදා ගනීමට අවශ්‍ය කටයුතු කරන බවත්, ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩනමින් අවසන් කර ගැනීමට බලාපොරොත්තු වන බව ද වැඩි දුරටත් කියා සිටියේය.

## පසුගිය වාර්තාවෙන් ඉදිරියට ගෙනාවාරිමාර්ග ගැටළු

| අ.අ | ඉදිරිපත් කළ අය | ගැටළුව | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 01 | සමගි ගොවි සංවිධානය | මහආර වැව අසල ඇති ඇල කණ්ඩිය කැඩී යාම පිළිබදව අවස්ථා කහිපයක දීම ඉදරිපත් කර තිබූ බව නේවාසික ව්‍යාපෘකි කළ:තුමිය කියා සිටියාය. | මෙහෙයුම් නඩත්තු අරමුදලින් සිදු කල හැකි බව සහකාර ඉංජිනේරු ඩබ්.ජී.සී කොස්තා මහතා පැවසීය. | වා.දෙ |
| 02. | රුහුණු ගොවි සංවිධානයේ සභාපති | මිගෝරිස් බස්නාවේ එක් පැත්තකින් කැඩුණු පැති බැම්ම සකස්කර දෙන ලෙසත් බිබුල බස්නාව ශුද්ධ කර දෙන ලෙසත් ඉල්ලීම. LB2 1 ඇලේ පළමු කුඹුරට ජලය ලබා ගැනීමට අපහසු බව පවසන ලදී. | මිගෝරිස් බස්නාව අලුත්වැඩියා කිරීමට මුදල් ලැබී ඇති බව සහකාර ඉංජිනේරු හිරාන් මහතා ප්‍රකාශ කර සිටියේය.<br><br>ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන බව පැවසීය. | වා.දෙ |
| 03 | ගජබා ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික | ගොඩගම ඇළේ කණ්ඩියට කි.මී.1ක් පමණ පස් දමා සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br><br>රක්ෂිතය වෙන් කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. | ඇස්තමේන්තු සකස් කර ඇති බව සහකාර වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසා සිටින ලදි ගොඩගම ඇළේ ගිලාබැස ඇති කොටස සාදා ගැනීම සදහා දකුණු පළාත් සභාව දැනුවත් කරන ලෙස වාරිමාර්ග ඉංජිනේරුතුමා පැවසීය.<br><br>ගොවි සංවධාන සහයෝගයෙන් වාරිමාර්ග මැෂින් යොදා තාවකාලිකව සැකසිය හැකි බවත් රක්ෂිත සීමාවන් හි දැමීමට ගොවි සංවිධාන විසින් පස් | වා.දෙ |

| | | | | |
|---|---|---|---|---|
| | | | සපයාගන්නේ නම් රක්ෂිත කණු ද ලබාදිය හැකි බව පැවසීය. | |
| 04 | ප්‍රගති ගොවි සංවිධානයේ සභාපති | 1.එදිරිසූරිය බස්නාව සුද්ධ කිරීමට චේන්සෝ එකක් සහ ස්කැවේටරයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.(අන්දර ගස් වැවී ඇත.)<br><br>2.දෙල් ගහ ළඟ ඇළේ පහළ කොටස සඳහා U ආස්තරණය කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br><br>3.බැරගම බෝගහ හන්දිය බටහිර පැත්තේ ඇළ කණ්ඩිය සේදී යාම නිසා කොන්ක්‍රීට් පාරටද හානි සිදුවී ඇත.<br><br>4.බෝගහ හන්දිය ප්‍රදේශයේ SLB ඇළ සහ SCB ඇළවල ජලය බෙදා හරිනු ලබන ස්ථානයේ දොරවල් අලුත් වැඩියා කරදෙන ලෙසත් රොඩිය රැක්කවල බස්නාව සුද්ධ කර දෙන ලෙසත් ඉල්ලා සිටියේය.<br>5. කුමුරුවල අතිරික්ත ජලය බස්නාවට බැස්සවීම සඳහා කුඹුරුවලට පයිප්ප ලබා දෙන ලෙස ද | අදාල මැෂින් දෙක ලබා දිය හැකි බව වාරිමාර්ග ඉංජිනේරුතුමා කියා සිටියේය.<br><br>ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය.<br><br>ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන බව ඉංජිනේරු මහතා පැවසීය<br>.<br><br>ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන බව ඉංජිනේරු මහතා පැවසීය<br><br>අවශ්‍ය බට ප්‍රමාණය ලබා දිය හැකි බව පැවසීය. | වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉල්ලා සිටින ලදී. | | |
| 05 | සරුකෙත ගොවි සංවිධානයේ ගරු සභාපති | 1. LB 2 1 කෙත් ඇලේ පයිප්පයක දොර කැඩී ඇති බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.<br>2.LB 3 ඇලේ පැතිබැම්මේ ආරම්භයේ සිට මීටර් 500 ක් ගිය පසු දකුණු පැත්තේ එක් තැනකින් කඩා ගෙන ගොස් ඇත .<br><br>3.අංක 2හා3 ඇළවල්වල ඇස්තමේන්තු සකස්කළත් තවම මෙම ඉදිකිරීම සිදුකර නොමැත .<br><br>4.අංක 01 ඇළේ අවසානයේ බස්නාව ශද්ධ කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | ඇස්තමේන්තු සකස් කර රුහුණුපුරට යවා ඇති බව වාරිමාර්ග ඉංජිනේරු මහතා පැවසීය.<br><br>2019 වර්ෂයේ ප්‍රතිපාදන වලින් සකස් කර දිය හැකි බව පවසා සිටින ලදී.<br><br>ඇස්තමේන්තු සකස් කරන බව පැවසීය.<br><br>ගොයම් කැපීමෙන් පසුව මැසින් ලබා දිය හැකි බව පැවසීය. | වා.දෙ. |
| 06 | වලව ගොවි සංවිධානයේ ගරු සභාපති | රොඩීමැල්ල බස්නාව හා මහවැව බස්නාව සුද්ධ කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | අම්බලන්තොට ප්‍රාදේශීය සභාව දැනුවත් කිරීමෙන් පසු එම ආයතනය සමග රැස්වීමක් යොදා ගන්නා ලෙසත් එම ආයතනයත් සම්බන්ධ කරගෙන ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරමට කටයුතු කරන බව වාරිමාර්ග ඉංජිනේරු මහතා ප්‍රකාශ කර සිටියේය. | වා.දෙ.<br>ගො.සං |
| 07 | පුබුදු ගොවි සංවිධානයේ ගරු ලේකම් | උනාව බස්නාව සුද්ධ කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි. | බස්නාව සුද්ධ කිරීම සදහා අනුමැතිය ලැබී ඇති බව | වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආර් බී 01 සහ ආර් බී 02 ඇළේ දොරවල් 02 හා ගෙවල් 02ක් අතරින් කුඹුරු වලට ජලය ලබා ගන්නා අතර එම කෙත් ඇළ මේ වනවිට වසා ඇති බව පවසන ලදි. | ඉංජිනේරු සහකාර හිරාන් මහතා පැවසීය.<br><br>ප්‍රදේශිය ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව පුබුදු ලේකම් යු.ජී සිරිසේන මහතා පවසන ලදි. | |
| 08 | සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් | ගලින්කුට්ටිවල බෝලාන පාර අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | වලව ගොවි සංවිධානයේ peiseip ව්‍යාපෘතියට ඇතුලත් කර ඇති බව ව්‍යාපාර කළමනාකාර තුමිය පවසා සිටියාය. | වා.දෙ. |
| 09 | ගාමිණී ගොවි සංවිධානයේ ගරු සභාපති | පන්සල් ඇළ කොන්ක්‍රීට් කර ඇතත් එහි පයිප්ප දැමීමට අපහසු වී ඇත්තේ අනවසර පයිප්ප දමා ඇති බැවින් ඒ පිළිබදව සුදුසු කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටියේය.<br><br>පාසල් ඇළේ සහ පන්සල් ඇළේ පැතිබැම් කැඩී ඇති හෙයින් ඒවා අලුත් වැඩියා කර දෙන ලෙසත් පැවසීය. | ලබන වසරේ peiseip ව්‍යාපෘතියෙන් සියලුම ඉදිකිරීම් සිදු කරන බව පැවසීය. | වා.දෙ. |
| 10 | සේනානායක ගොවි සංවිධානයේ ගරු සභාපති | 3 ඇළේ පයිප්පයේ දොරවල් කැඩී ඇති නිසා එය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි<br>.<br>2 ඇලේ සියඹලාගස්විල බස්නාව ශුද්ද කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි. | දොරවල් සකස් කර දිය හැකි බව ඉංජිනේරු සහකාර කොස්තා මහතා පවසන ලදී.<br><br>.<br><br>ඇස්තමේන්තු සකස් කරන බව පවසන ලදි. | වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සේනානායක ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් පාර කැඩී ඇති නිසා එය සකස් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි | | |
| 11 | දිමුතු ගොවි සංවිධානයේ ගරු ලේකම් | ළිද ළග ඇනිකට් එක ළග පාර කැඩී ඇති බැවින් එය අලුත් වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br><br>LB 4 B ඇලේ අවසාන කොටසේ 50 ක් පමණ U ආස්තරණය කොන්කීට් කර දෙන ලෙස ඉල්ලීය. | ඇස්තමේන්තු සකස් කර ඇති අතර ප්‍රතිපාදන ලැබීමෙන් පසුව එය සකස්කර ගත හැකි බව වාරිමාර්ග ඉංජිනේරු තුමා පවසන ලදී. | වා.දෙ. |
| 12 | ගෝඨාභය ගොවි සංවිධානයේ ගරු සභාපති | දිගත ප්‍රධාන කෙත් ඇලේ ආරම්භයේ මීටර් 15ක් පමණ කැඩී ගොස් ඇති නිසා ජලය ගෙන යාමට අපහසු බව පැවසීය. | .මූලික ප්‍රමුකතාවය මත අළුත්වැඩියා කිරිම සදහා ස්කැචේටරයක් ලබා දෙන බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසන ලදි. | වා.දෙ. |
| 13 | පැරකුම් ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික | කඩවර ඇළට උඩින් වතුර යාම නිසා දැඩි අපහසුතාවයට මුහුණ පෑමට සිදුවී ඇත. | ක්ෂේත්‍රපරීක්ෂණයක් සිදු කර අවශ්‍ය තීරණය ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසන ලදී. . | වා.දෙ. |
| 14 | ඉසුරු ගොවි සංවිධානයේ ගරු සභාපති මහතා | 4 ඇල ආස්තරණය තුලින් ජලය කාන්දු වන නිසා කුඹුරු වලට හානි සිදුවන බව පවසන ලදි.<br><br>5 වන කෙත් ඇලේ බෙන් බහින නිසා ඇළ කණ්ඩිය කඩා ගෙන ගොස් ඇත මේ නිසා ඇළ කොන්ක්‍රීට් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.<br>කුඩළු විල බස්නාව | පරීක්ෂා කර බලා තීරණයක් ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරුතුමා පවසන ලදි.<br><br>මුදල් ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව පවසන ලදී.<br><br>බස්නාව ශුද්ධ කර දීමට අවශ්‍ය කටයුතු කරන බව පවසන | <br><br><br>වා.දෙ. |

| | | | | |
|---|---|---|---|---|
| | | ශුද්ධ කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදි. | ලදී. | |
| 15 | නීල ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා | ටකරන්ලන්ද එල් බි 01 කෙත් ඇල පටු කර ඇති හෙයින් ජලය ගෙන යාමේ අපහසුතාවයකට මුහුණ දී ඇති බව පවසන ලදි. | ස්ථානීය පරීක්ෂණයක් සිදු කර බලා තීරණයක් ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරු තුමා ප්‍රකාශ කරන ලදී. | වා:දෙ |
| 16 | විජය ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා | SLB4 ඇලේ සමෘද්ධි පාලම අසල කොටසට පැති බැම්මක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. | වෙනත් ආයතන වලින් සහයෝගය ලබාගත හැකි නම් ඇස්තමේන්තුවක් සකස් කර දිය හැකි බව ඉංජිනේරු තමා පවසන ලදී. | වා:දෙ ගො:සං |
| 17 | වීර ගොවි සංවිධානයේ සභාපති මහතා | NRB ඇළේ ලාල්පවිල පැතිබැම්ම සකස් කර දෙන ලෙස ඉල්ලීය. | 2019 ප්‍රමඛතා ලැයිස්තුවට ඇතුලත් කර ඇති බව පවසන ලදී. | |
| 18 | සමගි ගොවි සංවිධානයේ සභාපති මහතා | ටෝනි මහතාගේ කුඹුරට කෙත් ඇලෙන් අගල් 2බටයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.<br><br>SLB ඇලේ ඉතිරි කොටස (100m)සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. | ව්‍යාපාර කමිටුවේ අනුමතිය අවශ්‍ය බව වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසීය.<br><br>ස්ථානීය පරීක්ණයක් සිදු කර තීරණයක් ගනා බව දන්වන ලදී. | |
| 19 | පැරකුම් ගොවි සංවිධානයේ සභාපති මහතා | රෙගියුලේටරයක් ලබා දෙන ඉල්ලා සිටින ලදි. (CPO 13 හඉරත්වල පාසලඅසල පාලම දක්වා) | ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තීරණයක් ගන්නා බව දන්වන ලදී. | |

## නව වාරිමාර්ග ගැටළු

| අ/අ | ඉදිරිපත් කල අය | ගැටළුව | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | ප්‍රගති ගොවි | දෙල්ගහ ඇලේ රක්ෂිත | | |

| | | | | |
|---|---|---|---|---|
| | සංවිධානයේ ගරු ඵාන්ඩාගාරික තුමා | ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටි අතර ගොවි සංවිධානයේ උප සබාපති තුමා රක්ෂිතය අනවසරයෙන් අල්ලාගෙන ඇති අතර එහි තැඹිලි පැළ හා පොල් පැළ සිටුවා ඇති බවත් ඔහුට අයිති ඇල කොටසේ දෙපස කොහිල වගා කර ඇති අතර එම ඇල කොටස ශුද්ධ කිරීමට විරුද්ධත්වය පල කරන බව ද ප්‍රකාශ කර සිටියේය. | | |
| 02 | වලව ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා | පුබුදු ගොවි සංවිධානයේ හිටපු ගරු සභාපති තුමාගේ ඇලේ එන වැඩි වතුර නිසා තමාගේ කුඹුර ජලයෙන් යට වන බව වලව ගොවි සංවිධානයේ ගරු සභාපති තුමා සිටි අතර මේ පිළිබව සුදුසු තීරණයක් ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.<br>කඩවර වැවේ වතුර SRB ඇලේ ඇවිත් වලව යායේ සිසිර මහතාගේ කුමුර යට වන බව ගරු සභාපති මහතා පැවසීය. | පුබුදු ගොවි සංවිධානයේ හිටපු සභාපති තුමා සමග සාකච්ඡා කිරීමෙන් පසු තීරණයක් ගන්නා බව වාරිමාර්ග ඉංජිනේරු තුමා පැවසීය.<br><br>ක්‍රිප්ස් ව්‍යාපෘතිය යටතේ ගොඩගම ඇලේ පාලමේ වැඩ කටයුතු ආරම්භ කරන බව වාරිමාර්ග ඉංජිනේරු තුමා කියා සිටියේය. | වා:දෙ ගො: සං |
| 03 | සහද ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමා | සුපිරින්ටන් යායේ බස්නාවෙන් කුමුරු වලට ජලය ලබා ගන්නා පයිප්ප පිලිබද ප්‍රශ්න ඇති බැවින් මේ පිළිබදව පරීක්ෂා කර බලා ඒ සදහා අදාල පයිප්ප ලබා දෙන ලෙස යෝජනා කළේය. | | |
| 04 | එකමුතු ගොවි සංවිධානයේ ගරු ලේකම්තුමා | පී 22 ඇලේ කණ්ඩිය කැඩී යන බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටියේය. | | |

## **PEISEIP ව්‍යාපෘතිය**

2019 වර්ෂයට ගොවි සංවිධාන 8 ක ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්ම (JAP) සකස් කිරීමට ඇති බව ත් එයින් මේ වන විට ගොවි සංවිධාන 5 ක ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්ම (JAP) සකස් කිරීම සිදු කර ඇති බවත් ව්‍යාපාර කළමනාකාර තුමිය ප්‍රකාශ කර සිටියාය.

2019/02/26 හා 27 යන දිනවල වලව හා ගෝඨාභය යන ගොවි සංවිධාන දෙකෙහි ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්ම සකස් කල බවත්,කාවන්තිස්ස ගොවි සංවිධානය සදහා මුදල් වෙන් වී ඇති බවත් වාරිමාර්ග කළමනාකරණ සංවර්ධන සංරචකය හා අනෙකුත් සියළුම සංරචක යටතේ මෙම ගොවි සංවිධානය සදහා සකසන ලද සියලුම උප ව්‍යාපෘති මෙම ව්‍යාපාර කමිටුවේ දී සම්මත කර ගන්නා ලෙස ව්‍යාපාර කළමනාකාර තුමිය ඉල්ලා සිටියාය.

ඒ අනුව වාරිමාර්ග සංවර්ධන සංරචකය යටතේ කාවන්තිස්ස හා ඵේරපුත්ත ගොවි සංවිධානවලට මේ වන විට සකසා ඇති උප ව්‍යාපෘති වන කසල බදුන් ස්ථානගත කිරීම කාවන්තිස්ස ගොවි සංවිධානය,දැන්වීම් පුවරු සවි කිරීම කාවන්තිස්ස හා ඵේරපුත්ත ගොවි සංවිධාන,කෘෂි නිෂ්පාදන අගය වැඩි කිරීමේ ව්‍යාපෘතිය ඵේරපුත්ත ගොවි සංවිධානය,නිරන්තර නඩත්තු ක්‍රමවේදය ශක්තිමත් කිරීම සදහා තණකොළ කපන මැෂින් ලබා දීම කාවන්තිස්ස ගොවි සංවිධානය, යන ව්‍යාපෘති සභා සම්මත කර ගන්නා ලෙස දැන්වීය. ඒ අනුව ඵේරපුත්ත ගොවි සංවිධානයේ ගරු සභාපති තුමාගේ හා පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපති තුමාගේ යෝජනා ස්ථීරත්වයෙන් මෙම ව්‍යාපෘති සභා සම්මත විය.

PEISEIP ව්‍යාපෘතිය යටතේ කොත්මලේ ජාත්‍යන්තර වාරිමාර්ග පුහුණු ආයතනයේ දී පැවැත්වුණු ඉදිකිරීම් තාක්ෂණය පිලිබද පුහුණු වැඩ සටහන ඉතා වැදගත් බව ඵේරපුත්ත ගොවි සංවධානයේ ගරු සභාපති මහතා කියා සිටියේය.

ඵේරපුත්ත ගොවි සංවිධානයේ PEISEIP ව්‍යාපෘතිය යටතේ වී වගා කටයුතු සදහා කාබනික පොහොර, බිත්තර වී,දහයියා අගුරු හා රසායනික පොහොර ද ගොවීන් හට ලබා දුන් අතර අක්කරයකට වී බුසල් 175 ක ප්‍රමාණයක් ලබා ගැනීමට හැකි වූ බව කෘෂිකර්ම උදේශක කාන්ති මහත්මිය පවසා සිටියාය.

මෙම ව්‍යාපෘතිය යටතේ තැටි නගුල් **2** ක්,මුං පියළි යන්ත්‍ර **02** ක්, බීජ වී සුද්ධ කරන මැෂින් **02** ක් ඵේරපුත්ත ගොවි සංවිධානයට ලබා දී ඇති බවත් අක්කර 5 බිත්තර වී ගොවිපලක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව ද එතුමිය වැඩි දුරටත් කියා සිටියාය.

**2018** වර්ෂයේ ක්‍රියාවලි විගණන කමිටුව පවත්වා වාර්තාව යවා ඇති බවත් ඊලග විගණන කමිටු අදාල කාලවල දී පමණක් පවත්වන බව නේවාසික ව්‍යාපෘති කළමනාකාර තුමිය ප්‍රකාශ කර සිටියාය.

සමස්ථයක් ලෙස ගත් විට ඵේරපුත්ත ගොවි සංවිධානයේ PEISEIP ව්‍යාපෘතිය යටතේ සිදු කල සියළු වැඩසටහන් සාර්ථක බව එම ගොවි සංවිධානයේ ගරු සභාපති සුදුසිංහ මහතා ප්‍රකාශ කර සිටියේය.

## කෘෂිකර්ම කටයුතු-මූලස්ථාන කෘෂිකර්ම උපදේශක -එන්.පී.ඒ ගුණවර්ධන මහතා

මහසභා පැවැත්වීමේ දී ගොවීන්ගේ සහභාගිත්වය අත්‍යාවශ්‍ය වන බැව් කෘෂිකර්ම උපදේශක තුමා පැවසීය. අස්වනු නෙලා ගැනීමෙන් පසු තැටි නගුල උපයෝගී කර ගෙන සී සෑමෙන් පසු වල් මර්ධනය පහසුවෙන් කරගත හැකි බවත් පිදුරු පිලිස්සීමෙන් වලකින ලෙස ගොවීන් දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටියේය. කල්වේලා ඇතිව බිත්තර වී සපයා ගැනීමෙන් ගොවීන්ට අනවශ්‍ය ප්‍රශ්න ඇති නොවන බැව් පැවසීය.

උස් ලියදි ඇති කුඹුරුවල අතිරේක බෝග වගා කිරීමෙන් අමතර ලාභයක් ලබා ගත හැකි මූලස්ථාන කෘෂිකර්ම උපදේශක මහතා ප්‍රකාශ කර සිටි අතර අමතර කන්නයේ වගා කිරීම සදහා 50% සහනාධාර ක්‍රමයට කව්පි බීජ ලබා දෙන බැව් පැවසීය.

සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් තුමා අද ගොවීන්ගේ ප්‍රශ්ණය පිළිබදව ගොවිජන සේවා කොමසාරිස් ජනරාල් දැනුවත් කල යුතු බවත් ප්‍රවේණිය වැඩි නොකරන ලෙස ඉල්ලා සිටියේය.

## **<u>වී අලෙවි මණ්ඩලය</u>** <u>-පී.අයි.ඩී.එස් හෙන්දහේවා මයා</u>

වී මිල දී ගැනීම ආරම්භ කර ඇති බවත් දෙහිගහලන්ද,අම්බලන්තොට ගබඩා පහසුකම් ප්‍රමාණවත් වන බවත් වී අලෙවි මණ්ඩලයේ නියෝජිත මහතා පැවසීය. දෙහිගහලන්ද ගබඩාවට පැමිණීමට අපහසු ගොවීන්ට ගොවි සංවිධානයේ ලිපියක් ලබාගෙන අම්බලන්තොට ගබඩාවට වී ලබාදිය හැකි බව ඒ මහතා වැඩි දුරටත් කියා සිටියේය.

සුහද ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා අදහස් දක්වමින් කියා සිටියේ වී අලෙවි මණ්ඩලයට ලබා ගන්නා වී ප්‍රමාණට කි,ග්‍රෑම් 5000 සිට 2000 දක්වා අඩු කර ඇති බවයි.

ව්‍යාපාර කමිටුවේ ගරු ලේකම් වරයාගේ ස්තූති කතාවෙන් පසු ව්‍යාපාර කමිටුවේ වැඩ කටයුතු අවසන් විය. මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2019/04/09 වන දින ව්‍යාපාර කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේ දී පැවැත්වේ.

Indrani

ලේකම්,
ව්‍යාපාර කළමනාකරණ කමිටුව
ව්‍යාපෘතිකළමනාකරු
රිදිගම ව්‍යාපාරය

කේ.කේ ඉන්ද්‍රානි
නේවාසික
රිදියගම ව්‍යාපාරය

msgm;a(-  01' wOHlaI jdßud¾. l<ukdlrK wxYh - fld<U -
ld(oe(i

02'm%dfoaYSh f,alï - wïn,kaf;dg$ yïnkaf;dg -
ld(oe(i

03' ksfhdacH lDIsl¾u wOHlaI^w'm'&-yïnkaf;dg -
ld(oe(i

04. lDIsrlaIK uKav,h -
ld(oe(i

05' jdßud¾. bxðfkare - wïn,kaf;dg -
ld(oe(i

06' f.dúck fiajd m%dfoaYsh ks,Odß - wïn,kaf;dg -
ld(oe(i

07' uQ,ia:dk lDIsl¾u WmfoaYl - wïn,kaf;dg -
ld(oe(i